# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1795/30 - 2013 ජනවාරි මස 30 වැනි බදාදා - 2013.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

### බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය යටතේ පැවත්වෙන පරීකෂණය

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල හා බල ශක්ති, මිනිස් බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියේ සඳහන් විධිවිධානව වලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් කරුණු/චෝදනා හේතු කොටගෙන කැලණිය ප්‍රාදේශීය සභාව කටයුතු කිරීමේදී ඉහත කී ප්‍රඥප්තියේ 2(1) වගන්ති යටතේ දක්වනු ලබන වරදවල් සිදු කර තිබේද යන්න පරීක්ෂා කර මාස 3ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ඒක පුද්ගල පරීක්ෂණ සභාවක් වශයෙන් විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඩබ්ලි කරුණාරත්න මැතිතුමා පත් කරමි.

පරීක්ෂා කළ යුතු කරුණු/චෝදනා නම්,

(අ) කැලණිය ප්‍රාදේශීය සභාව විසින් කටයුතු කිරීමේදී කැලණිය ප්‍රාදේශීය සභාව සතු කිරිබත්ගොඩ සතිපොළ 2011 අගෝස්තු මස 01 දින සිට 2011 දෙසැම්බර් මස 31 දක්වා කාල පරිච්ඡේදයට අදාළව කඩවත, දළුපිටිය, අංක 162/2 ලිපිනයෙහි කේ. ජී. ඩී. තිලකසිරි යන අයට ගිවිසුමකින් තොරව පවත්වාගෙන යාමට සැලැස්වීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තියට පටහැනිව ක්‍රියාකර බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියෙහි 2(1)(අ) හා/හෝ 2(1)ඈ වගන්තියෙහි සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

(ආ) කැලණිය ප්‍රාදේශීය සභාව විසින් කටයුතු කිරීමේදී කැලණිය ප්‍රාදේශීය සභාව සතු හුණුපිටිය වෙළඳ සංකීර්ණයෙහි එක් කඩ කාමරයක් සඳහා අවම ලංසුව රුපියල් ලක්ෂ දොළහක් විය යුතු බවට 2010 නොවැම්බර් මස 30 වැනි දිනැතිව කැලණිය ප්‍රාදේශීය සභාව සභා සම්මත කර තිබිය දී, එම අගය මත ටෙන්ඩර් කැඳවීමකින් තොරව එක් කඩ කාමරයක් සඳහා අවම ලංසුව රුපියල් ලක්ෂ හතරක් විය යුතු බවට 2011 ජූලි මස 29 දිනැතිව සභා සම්මත කිරීමෙන් බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තිය 2(1)(අ) හා/හෝ 2(1)(ඈ) වගන්තියෙහි සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

(ඇ) කැලණිය ප්‍රාදේශීය සභාව විසින් කටයුතු කිරීමේදී කැලණිය ප්‍රාදේශීය සභාව සතු හුණුපිටිය වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර දහසයක් සඳහා එක් කඩ කාමරයක් වෙනුවෙන් අවම ලංසුව රුපියල් ලක්ෂ හතරක් විය යුතු බවට

විධිමත් තක්සේරුවකින් තොරව සහා සම්මත කර ටෙන්ඩර් කැඳවීමට ක්‍රියා කිරීමෙන් බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තිය 2(1)(අ) හා/හෝ 2(1)(ඇ) වගන්තියෙහි සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

(ඇ) කැලණිය ප්‍රාදේශීය සභා විසින් කටයුතු කිරීමේදී කැලණිය ප්‍රාදේශීය සභාව සතු හුණුපිටිය වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර දහසයක් එක් කඩ කාමරක් සඳහා අවම ලංසුව රුපියල් ලක්ෂ දොළහක් වශයෙන් විය යුතු බවට කැලණිය ප්‍රාදේශීය සභාව සභා සම්මත කර තිබිය දී එකී අවම ලංසු මුදල රුපියල් ලක්ෂ හතරක් වශයෙන් විය යුතු බවට 2011 ජූලි 27 දින කැලණිය ප්‍රාදේශීය සභාව සම්මත කර ඒ අනුව කටයුතු කිරීමෙන් කැලණිය ප්‍රාදේශීය සභාවට රුපියල් එකසිය විසිඅට ලක්ෂයක් හෝ ඊට ආසන්න මුදලක් පාඩුවන ආකාරයට ක්‍රියා කිරීමෙන් බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1)(අ) වගන්තියෙහි සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

තවද බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතන වල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමසාරිස්වරයෙකු සතු බලතල මෙම ඒක පුද්ගල පරීක්ෂණ සභාව වෙත හිමිවන අතර, ඉහත සඳහන් කරුණු පරීක්ෂා කිරීමේදී අදාළ කරගත යුතු බවට හඳුනාගත් ලිඛිත හා වාචික සාක්ෂි පහත උපලේඛනයට ඇතුළත් කර ඇති බව ද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

ප්‍රසන්න රණතුංග,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,<br>
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,<br>
පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල හා බල ශක්ති,<br>
මිනිස් බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය,<br>
බස්නාහිර පළාත.

2013 ජනවාරි මස 17 වැනි දින,<br>
කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,<br>
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

*වාචික සාක්ෂි :*

1. කැලණිය ප්‍රාදේශීය සභාවේ හිටපු ලේකම් එච්. ඒ. හේමපාල මහතා,
2. කැලණිය ප්‍රාදේශීය සභාවේ සභා කටයුතු භාර කළමනාකරණ සහකාර,
3. ගම්පහ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ විමර්ශන නිලධාරී කේ. ගාමිණී සෝමරත්න මහතා,
4. කැලණිය ප්‍රාදේශීය සභාවේ කඩකාමර බදු දීමට අදාළ කළමනාකරණ සහකාර,
5. ටී. එම්. ස්වර්ණා පීරිස් මහත්මිය, ලේකම්, කැලණිය ප්‍රාදේශීය සභාව.

*ලිඛිත සාක්ෂි :*

1. කැලණිය ප්‍රාදේශීය සභාවේ, කිරිබත්ගොඩ සතිපොළ සම්බන්ධයෙන් 2010 ජනවාරි මස 31 දිනෙන් අත්සන් කර ඇති ගිවිසුම.
2. කැලණිය ප්‍රාදේශීය සභාවේ 2011.06.30 දිනැති සභා වාර්තාව.
3. කැලණිය ප්‍රාදේශීය සභාව කිරිබත්ගොඩ සතිපොළ ටෙන්ඩර් කිරීමට අදාළව 2011.07.08 දිනැති දිනමිණ පුවත්පතෙහි පළකළ දැන්වීම.
4. කැලණිය ප්‍රාදේශීය සභාවේ අංක කැප්‍රාස/ප්‍රකා/කෝ/සතිපොළ/බදුදීම සහ 2011.08.01 දිනැති ලිපියෙහි සහතික පිටපත.
5. කැලණිය ප්‍රාදේශීය සභාවේ 2010.11.30 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව.
6. කැලණිය ප්‍රාදේශීය සභාවේ 2011.07.29 දිනැති මහ සභා රැස්වීම් වාර්තාව.
7. කැලණිය ප්‍රාදේශීය සභාවේ 2011.07.29 දිනැති මහ සභා රැස්වීමට අදාල න්‍යාය පත්‍රය.
8. කැලණිය ප්‍රාදේශීය සභාවේ හුනුපිටිය වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර බදු දීමට අදාල ලිපි ගොනුව.

02-457

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.